**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition - Parlimaent of Sri Lanka

2023.04.14

<u>අන්ධකාර සමය නිමා වේවා. සෞභාග්‍ය සම්පන්න අලුත් අවුරුද්දක් උදා වේවා!</u>

සෑම වසරකම බක් මාසයේ සූර්යය සංක්‍රාන්තියත් සමඟ සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණයෙන් උදාවන සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද මෙරට සිංහල සහ දමිළ ජනතාව උත්සවශ්‍රීයෙන් සමරනු ලබන මහා සංස්කෘතික මංගල්‍යයකි.

වසර කිහිපයක් මුළුල්ලේ ලක්වාසී ජනතාවට අලුත් අවුරුදු උදාවූයේ අභියෝග රැසක් මධ්‍යයේ වුවත් සමස්ත ජනතාවගේ එකම බලාපොරොත්තුව වන්නේ රටට, ජනතාවට සෞභාග්‍යය හා නීරෝගීමත් භාවය ප්‍රාර්ථනා කිරීමය. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සමාජ සම්බන්ධතා වැඩි දියුණු වීමටත් පැරණි සිරිත් විරිත් නොනැසී ඉදිරියට පවත්වාගැනීමටත් එකිනෙකා අතර අන්‍යෝන්‍ය විශ්වාසය වැඩි දියුණු වීමටත් ඉවහල් වේ.

අත්‍යන්තයෙන්ම ජන සමාජයට සාධනීය ගුණ යහපත්කම් සහ ආචාර ධර්ම වපුරන මහා සාර සංස්කෘතික මංගල්‍යය වන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද මානව සංහිඳියාව උදෙසා දොරටු විවර කරන සංහිඳියාවේ උත්සවයක් ද වෙයි. සොබාදහමත් මිනිසාත් අතර වන්නේ ආදීකල්පිත අවියෝජනීය බැඳීමකි. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසා ස්වභාදහමට කෘතගුණ දැක්වීමට අවස්ථාවන් සොයා ගනියි. සිංහල හින්දු අලුත් අවුරුද්ද තුළින්ද තුළින් ද අර්ථ ගැන්වෙන්නේ එකේ කෘතගුණ දැක්වීමේ සැබෑ ස්වරූපයයි.

ස්වයංපෝෂිත ආර්ථික රටාවක් පැවති අපේ රට මේ වන විට කඳුළු සලන පාරාදීසයක් බවට පත්ව ඇති අතර පවුලේ සියලු සියලු දෙනා එක්ව සතුටින් සාමයෙන් සහ සැනසිල්ලෙන් අලුත් අවුරුද්ද සැමරීමේ අවස්ථාව පවා වසර කිහිපයක සිට අහිමි වී තිබේ. අපේ රටේ ජනතාවගේ සාමාන්‍ය ජීවන තත්ත්වයට අසාමාන්‍ය ලෙස අභියෝග පැමිණ තිබේ.

මේ අන්ධකාර සමය නිමා වී, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සෞභාග්‍ය සම්පන්න දීප්තිමත් අනාගතයක් උදෙසා අධිෂ්ඨානශීලීව පෙළ ගැසීමේ ශක්තිය අපේ රටේ සමස්ත පුරවැසි පරපුරට ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකතන:<br>Telephone:<br>தொலைபேசி | 011 2777253<br>011 2699171 | ෆැක්ස්:<br>Fax:<br>தொலைநகல்: | 011 2699174 | විද්‍යුත් තැපෑල:<br>Email:<br>மின்னஞ்சல்: | sajith_p@dialogsl.net |

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7 I இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7 I No 30, Sir Marcus Fernando Mawatha Colombo 7